# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14.240 – 1964 නොවැම්බර් 27 වැනි සිකුරාද – 1964 11.27**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**


# I වන කොටස: (I) වන ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**අ. ආ. කා. අංක. ඕ. 457/57**

පිලිපීනය වෙනුවෙන් සුවිශේෂ හා පූර්ණ බලැති තානාපති වශයෙන් ලංකාවේ පෙනී සිටීමට බලය පවරනු ලැබූ යුසුප් ආර්. අබුබකර් උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය, මහා රාජිණින් වහන්සේ වෙනුවෙන්, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාර ගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

 නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1964 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කායර්‍යාලයේ දී ය.

11–1143

---

**අ. ආ. කා. අංක. ඕ. 330/49**

මැලේසියාව වෙනුවෙන් මහා කොමසාරිස් වශයෙන් ලංකාවේ පෙනී සිටීමට බලය පවරනු ලැබූ ඉන්චේ ශායිටුන් ඊබ්‍රහිම් බින් අහමඩ් උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය, මහා රාජිණින් වහන්සේ වෙනුවෙන්, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාර ගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1964 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කායර්‍යාලයේ දී ය.

11–1141

---

## මිළ පාලන දැන්වීම්

**ඇම්.ඇල්. 1964/5 වන අංකය දරණ ආහාර මිළ නියෝගය** **අතිරේක ආහාර ද්‍රව්‍ය (එකතුළ යුතු නිත්‍ය මිළක් නියම කිරීම)**

### මිළ පාලන පනත

**නියෝගය**

මාතලේ පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක තැන්පත් වික්ටර් චන්ද්‍රතිලක බන්ඩාර උනන්තැන්න වන මම, (173 අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වන වගන්තියෙන් සහ එම පනතේ 3 (2) වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1964 ඔක්තෝබර් මස 2 වන දින දරණ අංක 14,190 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරණ ලද 1964 සැප්තැම්බර් මස 28 වන දින හා ඇම්.ඇල්. 1964/4 වන අංකය දරණ ආහාර මිල නියෝගය මේ දැන් සිට මේ නියෝගයෙන් අවලංගු කරමි.

(2) (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ සකස්ව කොළඹ නාගරිකයේ දැනට බල පවත්නා තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ ගණනට මීට යාකර ඇති දෙවන උපලේඛනයේ තුන්වන තීරයේ සඳහන් ගණන් එකතු කිරීමෙන් ගැණෙන මිළ ගණන් තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දෙවන උපලේඛනයේ පළවන තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයකින් දළබර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ ගණන් ලෙස ද ඉහත සඳහන් මිළ පාලන පනත යටතේ සකස්ව කොළඹ නාගරිකයේ දැනට බලපවත්නා සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ ගණනට මෙයට යාකර ඇති දෙවෙනි උපලේඛනයේ හතරවන තීරයේ සඳහන් ගණන් එකතු කිරීමෙන් ගැණෙන මිළ ගණන් සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් පාරිභෝගිකයකුට විකිණීමේ දී දෙවෙනි උපලේඛනයේ පළවන තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ ගණන් ලෙස ද මේ දැන් සිට නියම කරන අතරම මේ මිළ ගණන් වලට වැඩියෙන් දෙවෙනි උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් එම උපලේඛනයේ දෙවෙනි තීරයේ අනු පිළිවෙළින් පෙන්වා ඇති පළවන උපලේඛනයේ සවිස්තරව විග්‍රහකොට ඇති මාතලේ පාලන දිස්ත්‍රික්කයේ සීමාවන් තුළ නොවිකිණිය යුතු බවද නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්‍යය සඳහා—

(අ) දෙවෙනි උපලේඛනයේ පළවන තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම හෝ එම උප ලේඛනයේ පළවන තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) දෙවන උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම දෙවන උපලේඛනයේ පළවන තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බවද නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහණයක, දෙවන උපලේඛනයේ පළවන තීරයේ සඳහන් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ද්‍රව්‍යයෙන් සුදුසු ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍යය සඳහා මේ නියෝගයෙන් වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගණුදෙනු කාරයකුට පැහැදිළිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවද නියම කරමි.

(6) එසේම, මෙම නියෝගයේ කාර්ය සඳහා ''රාත්තල '' හෙවත් '' රා '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බරක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම දෙවන උපලේඛනයේ පළවන තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හෝ එම උපලේඛනයේ පළවන තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින් මිලට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන් ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බව ද නියම කරමි.

(8) දෙවන උපලේඛනයේ පළවන තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණන ලබන ද්‍රව්‍යය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් නැත හොත් බහාලනු ලැබේ නම් එහි මිලත් එම උපලේඛනයේ තුනේ සිට හතර දක්වා ඇති තීරවල සඳහන් මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

1964 නොවැම්බර් මස 23 වන දින, පෙරවරු 9.00 ට මාතලේ දී අත්සන් කරණ ලදී.

වී. සී. බී. උනන්තැන්න,
මාතලේ පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක.

## පළමුවන උපලේඛනය

**අංක 1 දරණ කොට්ඨාශය.**—කුඹියන්ගොඩ, කොටුවේගෙදර සහ අළුවිහාරේ හැර මාතලේ නගර සභා කොට්ඨාශය.

**අංක 2 දරණ කොට්ඨාශය.**—(අ) මාතලේ නගර සභා කොට්ඨාශය, ඕවිළිකන්ද සහ පරණගන්තැන්න හැර මාතලේ ප්‍රා.ආ.නි. කොට්ඨාශය, (ආ) වැහිගල, පොල්වත්තාකන්ද, වෙලන්ගහවත්ත සහ අඹන්ගඟ කෝරළය හැර රත්තොට ප්‍රා.ආ.නි. කොට්ඨාශය, (ඇ) මාතලේ නගර සභා කොට්ඨාශයට අයත් කුඹියන්ගොඩ, කොටුවේගෙදර සහ අළුවිහාරේ.

**අංක 3 දරණ කොට්ඨාශය.**—(අ) දඹුල්ල ප්‍රා.ආ.නි. කොට්ඨාශය, (ආ) ගලේවෙල ප්‍රා.ආ.නි. කොට්ඨාශය, (ඇ) රත්තොට ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ අඹන් ගඟ කෝරළයේ (කොටස) සහ වැහිගල, පොල්වත්තාකන්ද සහ වෙලන් ගහවත්ත, (ඈ) දඹුල්ල ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ අඹන්ගඟ කෝරළයේ (කොටස), (ඉ) මාතලේ ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ පරණගන්තැන්න සහ ඕවිළිකන්ද.

**අංක 4 දරණ කොට්ඨාශය.**—ලග්ගල ප්‍රා.ආ.නි. කොට්ඨාශය.

## දෙවන උපලේඛනය

| 1 වන තීරය වර්ගය | 2 වන තීරය කොට්ඨාශය | 3 වන තීරය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් කොළඹ නාගරිකයේ මිළට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | 4 වන තීරය සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක් කොළඹ නාගරිකයේ මිළට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. |
|---|---|---|---|
| එළු (රතුළුණු සහ වික්බෙලාපූර් හැර වෙනත් සියළුම වර්ග) ... | 1 ... | 2 55 ... | 0 02 |
| | 2 ... | 2 95 ... | 0 03 |
| | 3 ... | 3 35 ... | 0 04 |
| | 4 ... | 3 95 ... | 0 05 |
| කොත්තමල්ලි ... ... ... ... | 1 ... | 3 55 ... | 0 03 |
| | 2 ... | 3 95 ... | 0 04 |
| | 3 ... | 4 35 ... | 0 05 |
| | 4 ... | 4 95 ... | 0 06 |
| පියළි නොකළ උළුදු ... ... ... ... | 1 ... | 3 55 ... | 0 03 |
| | 2 ... | 3 95 ... | 0 04 |
| | 3 ... | 4 35 ... | 0 05 |
| | 4 ... | 4 95 ... | 0 06 |
| මුංඇට ... ... ... ... | 1 ... | 3 55 ... | 0 03 |
| | 2 ... | 3 95 ... | 0 04 |
| | 3 ... | 4 35 ... | 0 05 |
| | 4 ... | 4 95 ... | 0 06 |
| කෝර පරිප්පු ... ... ... ... | 1 ... | 3 55 ... | 0 03 |
| | 2 ... | 3 95 ... | 0 04 |
| | 3 ... | 4 35 ... | 0 05 |
| | 4 ... | 4 95 ... | 0 06 |

## දෙවන උපලේඛනය—සම්බන්ධිතයි

| 1 වන තීරය<br>වර්ගය | 2 වන තීරය<br>කොට්ඨාශය | 3 වන තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් කොළඹ නාගරිකයේ මිළට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වන තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක් කොළඹ නාගරිකයේ මිළට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| කඩල පරිප්පු ... ... ... ... | 1 ... | 3 55 ... | 0 03 |
| | 2 ... | 3 95 ... | 0 04 |
| | 3 ... | 4 35 ... | 0 05 |
| | 4 ... | 4 95 ... | 0 06 |
| සියඹලා ... ... ... ... | 1 ... | 3 55 ... | 0 03 |
| | 2 ... | 3 95 ... | 0 04 |
| | 3 ... | 4 35 ... | 0 05 |
| | 4 ... | 4 95 ... | 0 06 |
| අර්තාපල් ... ... ... ... | 1 ... | 2 55 ... | 0 02 |
| | 2 ... | 2 95 ... | 0 03 |
| | 3 ... | 3 35 ... | 0 04 |
| | 4 ... | 3 95 ... | 0 05 |
| රතුළූණු ... ... ... ... | 1 ... | 3 55 ... | 0 03 |
| | 2 ... | 3 95 ... | 0 04 |
| | 3 ... | 4 35 ... | 0 05 |
| | 4 ... | 4 95 ... | 0 06 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

11–1145

---

**අංක ඇන්. ඊ. 93 දරණ ආහාර මිළ නියෝගය** **අතිරේක ආහාර ද්‍රව්‍ය**

## මිළ පාලන පනත

### නියෝගය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක තැන්පත් අමරවංශ බණ්ඩාර ඇල්කඩුවේ වන මම, (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් හා ඒ සමග කියවෙන 3 (2) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව මෙම නියෝගයෙන්—

(1) 1962 සැප්තැම්බර් මස 19 වැනි දින අංක 13,308 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඇන්. ඊ. 81 දරණ මිළ නියෝගය අද සිට අවලංගු කරමි.

(2) 173 වන අධිකාරය වන මිළ පාලන පනත යටතේ සකස් වූ කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දෙකු විසින් දැනට විකිණිය හැකි උපරිම තොග මිළ ගණනට මීට යාකර ඇති 2වැනි උපලේඛනයේ ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය දළ බර හොණ්ඩරයක් පළමුවැනි උපලේඛනයේ අනුපිළිවෙලින් සඳහන් අංක 1, 2, 3, 4, 5 සහ 6 යන ප්‍රදේශවලට තොග වශයෙන් මේ මොහොතේ සිට විකිණිය හැකි වැඩි ම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(3) 173 වන අධිකාරය වන ආහාර මිළ පාලන පනත යටතේ සකස් වූ කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දෙකු විසින් දැනට විකිණිය හැකි සිල්ලර උපරිම මිළ ගණනට මෙයට යාකර ඇති 3 වැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍ය ශුද්ධ බර රාත්තලක් 1 වැනි උපලේඛනයේ සඳහන් අංක 1, 2, 3, 4, 5 සහ 6 යන ප්‍රදේශවලට සිල්ලර වශයෙන් මේ මොහොතේ සිට විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(4) මෙම නියෝගයේ කාර්යය සඳහා —

(අ) 2 වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් කොයි අන්දමින් විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) 3 වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකුණන ලෙස සලකන බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(5) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම 2 වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ හා 3 වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කොට බාල කර කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක 2 වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ හා 3 වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනයේ යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මෙම නියෝගයෙන් නියම කරන ලද වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිශ්‍ර පුවරුවක සඳහන් කොට එම භාජනයට සම්බන්ධකොට ඇති ද්‍රව්‍ය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලි ලෙස පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(7) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍යය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව ද මෙයින් නියම කරමි.

(8) තවද. මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම 2 වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා 3 වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් —

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඇ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන් ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බව නියම කරමි,

(9) දෙවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් හා 3 වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබුවේ නම්, එහි මිළත් 2 වැනි උපලේඛනයේ 2 වැනි තීරයේ හා 3 වැනි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් බව ද නියම කරමි.

(10) මෙම නියෝගය උඩ හේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයට අඩංගු නොවේ.

1964 නොවැම්බර් මස 21 දින පෙ.ව. 11.30ට නුවරඑළියේ කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ඒ. බී. ඇල්කඩුවේ,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලකතැන.

## පළමුවැනි උපලෙඛනය

**අංක 1 දරණ ප්‍රදේශය.—**

ගම්මුලාදෑණි කොට්ඨාශ : මාවෙල, මාස්වෙල, මොරපේ, කඩදොර, හපුගස්තලාව, දෝරුවාදෙනිය, හරන්ගල, නවන්ගම, කලපිටිය, හැඳුනාව, රාවනා ගොඩ, විජයබාහුකන්ද, කොටගල, තලවකැලේ, ආගරපතාන

**අ.ක 2 දරණ ප්‍රදේශය.—**

ගම්මුලාදෑනි කොට්ඨාශ : මැතගම, මඩකුඹුර, කඩදොරපිටිය, දුනුකේදෙනිය, කුඹල්ඔළුව, නියන්ගන්දොර, සංගිලිපාලම, රම්බොගඩම, පනන්ගම්මන, රම්බොඩ වටුම, කොටගේපිටිය, තිස්පනේ, වටද්දර, රොජසන්ගම

**අංක 3 දරණ ප්‍රදේශය.—**

ගම්මුලාදෑනි කොට්ඨාශ : නුවරඑළිය, කඳපොල, නානුඔය, නිල්දන්ඩාහින්න, හරස්බැද්ද, වතුමුල්ල, පට්ටිපොල, ගොරඩිහෙල, කැටකඳුර, තිබ්බටු ගොඩ, පන්නල, කුඹල්ගමුව

**අංක 4 දරණ ප්‍රදේශය.—**

ගම්මුලාදෑනි කොට්ඨාශ : රාගල, රුපහ, මාලියද්ද, කුරුපනාවෙල, අඹලියද්ද, අරුක්වත්ත

**අංක 5 දරණ ප්‍රදේශය.—**

ගම්මුලාදෑනි කොට්ඨාශ : උඩමාදුර, කලගන්වත්ත, ගල්කැටිවල, අඹන්වැල්ල, දෙනාබුරේ, කුඹුක්වෙල, බටගොල්ල, මඩුල්ල.

**අංක 6 දරණ ප්‍රදේශය.—**

ගම්මුලාදෑනි කොට්ඨාශය : බොලගන්දවෙල

## දෙවැනි උපලේඛනය

| පළමුවැනි තීරය<br>විස්තර | දෙවැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | | | | | |
|---|---|---|---|---|---|---|
| | අංක 1 ප්‍රදේශය<br>රු. ශ. | අංක 2 ප්‍රදේශය<br>රු. ශ. | අංක 3 ප්‍රදේශය<br>රු. ශ. | අංක 4 ප්‍රදේශය<br>රු. ශ. | අංක 5 ප්‍රදේශය<br>රු. ශ. | අංක 6 ප්‍රදේශය<br>රු. ශ. |
| අළුනු (රතුළුනු සහ වික්බෙල්පූර් හැර වෙනත් සියළුම) | 1 90 | 2 05 | 2 20 | 2 35 | 2 45 | 2 55 |
| කොත්තමල්ලි | 2 90 | 3 05 | 3 20 | 3 35 | 3 45 | 3 55 |
| පියලි නොකළ උළුඳු | 2 90 | 3 05 | 3 20 | 3 35 | 3 45 | 3 55 |
| මුංඇට | 2 90 | 3 05 | 3 20 | 3 35 | 3 45 | 3 55 |
| කෝර පරිප්පු | 2 90 | 3 05 | 3 20 | 3 35 | 3 45 | 3 55 |
| කඩල පරිප්පු | 2 90 | 3-05 | 3 20 | 3 35 | 3 45 | 3 55 |
| සියඹලා | 2 90 | 3 05 | 3 20 | 3 35 | 3 45 | 3 55 |
| අර්තාපල් | 1 90 | 2 05 | 2 20 | 2 35 | 2 45 | 2 55 |
| රතුළුනු | 1 90 | 2 05 | 2 20 | 2 35 | 2 45 | 2 55 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

## තුන්වැනි උපලේඛනය

| පළමුවැනි තීරය<br>විස්තර | දෙවැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | | | | | |
|---|---|---|---|---|---|---|
| | අංක 1 ප්‍රදේශය<br>රු. ශ. | අංක 2 ප්‍රදේශය<br>රු. ශ. | අංක 3 ප්‍රදේශය<br>රු. ශ. | අංක 4 ප්‍රදේශය<br>රු. ශ. | අංක 5 ප්‍රදේශය<br>රු. ශ. | අංක 6 ප්‍රදේශය<br>රු. ශ. |
| දෙවැනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් අතිරේක ආහාර ද්‍රව්‍යය | 0 02 | 0 02 | 0 03 | 0 03 | 0 04 | 0 06 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ ගණන් නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතා වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් මෙම ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

11–1144

---

**1964 අංක ඇම් ඇන්/1 දරණ ආහාර මිළ නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය**

## මිළපාලන පනත

### නියෝගය

මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් සන්දර සේකරම් සිවසුබ්‍රමනියම් වන මම, 173 වෙනි පරිච්ඡේදය දරණ මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමඟ කියවෙන 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1963 අගෝස්තු 30 වෙනි දින අංක 13,744 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1963 අගෝස්තු 22 දින අංක එම් එන්/10 දරණ ආහාර මිළ නියෝගය වහාම ක්‍රියාවේ යෙදෙන ලෙස මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) 1950 අංක 29 දරණ ආහාර මිළ පාලන පනත යටතේ සකස් වූ කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දෙකු විසින් දැනට විකිණිය හැකි උපරිම තොගමිළ ගණනට, මෙයට යාකර ඇති දෙවෙනි උපලේඛනයේ 2, 4 සහ 6 වැනි තීරයන්හි සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ පළමුවැනි තීරයෙහි විස්තර කරන ලද ද්‍රව්‍ය දළ බර හොණ්ඩරයක් අනු පිළිවෙළින් ඇති (මෙයට යා කර ඇති පළමුවැනි උප ලේඛනයේ සඳහන්) අංක 1, 2 සහ 3 යන ප්‍රදේශවල තොග වශයෙන් වහාම ක්‍රියාවේ යෙදෙන ලෙස විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(3) 1950 අංක 29 දරණ ආහාර මිළ පාලන පනත යටතේ සකස් වූ කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දකු විසින් දැනට විකිණිය හැකි උපරිම සිල්ලර මිළ ගණනට මෙයට යාකර ඇති දෙවෙනි උපලේඛනයේ 3, 5 සහ 7 වැනි තීරයන්හි සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උප ලේඛනයෙහි පළමුවැනි තීරයෙහි විස්තර කරන ලද ද්‍රව්‍ය සිල්ලර රාත්තලක් අනු පිළිවෙලින් ඇති (මෙයට යාකර ඇති පළමුවැනි උප ලේඛනයේ සඳහන්) අංක 1, 2 සහ 3 යන ප්‍රදේශවල සිල්ලර වශයෙන් වහාම ක්‍රියාවේ යෙදෙන ලෙස විකිණියහැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(4) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) දෙවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍ය ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ දෙවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍ය වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) දෙවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍යයක් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්, නියම කරමි.

(5) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම දෙවැනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් කිසිම ආහාර ද්‍රව්‍යයක් අන්‍ය ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(6) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ යම් වාහනයක දෙවැනි උප ලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍ය තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා, එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයෙන් වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩුනොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන්කොට එම භාජනයට සම්බන්ධකොට එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(7) එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියෝග කරමි.

(8) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, දෙවෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍යයන් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා දෙවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍යයන් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය ;

(ආ) ආහාර ද්‍රව්‍ය විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද, යන වග ඇතුලත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(9) දෙවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍යයන් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් හෝ විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, හෝ බාරදෙන යම්කිසි දෙයක් වෙත්නම්, එහි මිළත් දෙවෙනි උපලේඛනයේ 2, 3, 4, 5,6 සහ 7 වෙනි තීරවල සඳහන් මිළ ගණන්වලට ඇතුලත් බවද නියම කරමි.

1964 නොවැම්බර් මස 18 වෙනි දින අපරභාග 3.00ට මන්නාරම් කොටුවේ ආහාර පාලන කාර්යාලයේදී අත්සන් කරන ලදී.

සන්දර සේකරම් සිවසුබ්‍රමනියම්,
මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

ආහාර පාලන කාර්යාලය,
කොටුව, මන්නාරම

## පළමුවැනි උපලේඛනය

**පළමුවැනි ප්‍රදේශයට අයත් සීමාවන්**

මන්නාරම් සුලු නගර සහ ගම්කාර්ය සභා ප්‍රදේශ, මන්නාරම් නැගෙනහිර, මන්නාරම් බටහිර, (තලේ මන්නාරම ග්‍රාමසේවක ප්‍රදේශ හැර), ඉරු කුලම් පිඩ්ඩි, වන්කාලෙයි, මාන්තෙයි දකුණ, නානාට්ටන්, නැගෙනහිර සහ නානට්ටන් බටහිර

**දෙවැනි ප්‍රදේශයට අයත් සීමාවන්**

තලේමන්නාරම ග්‍රාමසේවක කොට්ඨාශය, මාන්තෙයි උතුර, පෙරුන්කාලි පත්තු, (පෙරිය මඩු ජන පදය හැර) මුසලි උතුර, මුසලි දකුණ (මරිච්චිකට්ටි ග්‍රාමසේවක ප්‍රදේශය හැර)

**තුන්වැනි ප්‍රදේශයට අයත් සීමාවන්**

පෙරියමඩු ජන පදය, ඉලුප්පුකඩවෙයි, මරිච්චි කට්ටි ග්‍රාමසේවක ප්‍රදේශය, පනන්කාමම් සහ මේත් කුමුලෙයි

## දෙවැනි උපලේඛනය

| පළමුවැනි තීරය | පළමුවැනි ප්‍රදේශය | | දෙවැනි ප්‍රදේශය | | තුන්වැනි ප්‍රදේශය | |
|---|---|---|---|---|---|---|
| | දෙවැනි තීරය තොග වෙළෙන්දකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | තුන්වැනි තීරය සිල්ලර වෙළෙන්දකු විසින් රාත්තලක් සිල්ලරට කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | හතරවැනි තීරය තොග වෙළෙන්දකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | පස්වැනි තීරය සිල්ලර වෙළෙන්දකු විසින් රාත්තලක් සිල්ලරට කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | හයවැනි තීරය තොග වෙළෙන්දකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | හත්වැනි තීරය සිල්ලර වෙළෙන්දකු විසින් රාත්තලක් සිල්ලරට කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ළූනු (රතු ළූනු සහ වික්බෙලාපූර් හැර වෙනත් සියලුම)<br>රතුළූනු<br>අර්තාපල් | 2 75 ... | 0 03 ... | 2 90 ... | 0 03 ... | 3 0 ... | 0 04 |
| කොත්තමල්ලි ...<br>පියලි නොකල උඳු<br>මුං ඇට ...<br>තෝර පරිප්පු ...<br>මසූර් පරිප්පු (පිටරට පාහින ලද 1 වෙනි වර්ගය)<br>මසූර් පරිප්පු (මෙරට පාහින ලද (2වෙනි වර්ගය)<br>සියඹලා ...<br>සක්කර | 3 75 ... | 0 04 ... | 3 90 ... | 0 04 ... | 4 0 ... | 0 05 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය. මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

11—1146

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි